චක්‍ර ලේඛ අංක: 04/2004 (1)

මගේ අංකය:- බප/සසේකො/ලේ/ති
සමූපකාර සේවක කොමිෂන් සභාව,
අංක 50, කිතුල්වත්ත පාර,
කොළඹ 08.
2004.11.23

බස්නාහිර පළාතේ සියළුම
සමූපකාර සමිති සභාපතිවරුන් වෙත,

<u>අයවැයෙන් වැඩි කළ රු. 1250/- ක දීමනාව</u>
<u>සමූපකාර සේවකයන්ට ලබා දීම</u>

ඉහත සඳහන් කරුණ සම්බන්ධයෙන් ම විසින් නිකුත් කරන ලද 4/2004 (2)004.09.21 දිනැති චක්‍රලේඛයට වැඩිදුරටයි.

එම චක්‍රලේඛයේ 2 වන ඡේදයේ 11 වගන්තිය පහත සඳහන් පරිදි සංශෝධනය කරන ලද බව මෙයින් දන්වා සිටිමි.

විවිධ සේවා සමූපකාර සමිතිවල එප් 28 මාසික මෙහෙයුම් වාර්තාව අනුව ග්‍රාමීය බැංකු අංශය හැර අනෙකුත් සියළුම මාර්ගවලින් උපයන ලාභාංශ පදනම් කොට පහත සඳහන් සීමාවන් යටතේ ගෙවීම් කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කළයුතු ය. විවිධ සේවා සමූපකාර සමිතිවල ග්‍රාමීය බැංකු අංශයේ ලාභවලින් කිසිදු අනුපාතයක් මේ සඳහා යොදා නොගැනීමට ක්‍රියා කළයුතු වන්නේ ය.

| ලාභාංශ සීමා (මාසික අතිරික්තය) ග්‍රාමීය බැංකු අංශය හැර | ගෙවිය යුතු අතිරේක දීමනාව |
|---|---|
| ලක්ෂ (03) යි හට වැඩි | රු. 1250/- |
| ලක්ෂ 2.5 සිට 3 දක්වා | රු. 750/- |
| ලක්ෂ 2 සිට 2.5 දක්වා | රු. 450/- |
| ලක්ෂ 1.5 සිට 2 දක්වා | රු. 300/- |

උපාධිධාරීන් සඳහා දැනටමත් රු. 2500/- ක දීමනාවක් ගෙවන බැවින් තනතුරු දරන කාර්ය මණ්ඩලයේ වැටුප් විෂමතාවයක් ඇතිවී ඇති බැවි වාර්තාවන හෙයින් සංශෝධනයන් අනුව මෙම දීමනාව උපාධිධාරීන්ට ගෙවීම තාවකාලිකව නතර කරන අතර ඒ පිළිබඳව පසුව උපදෙස් ලබා දෙන බවත් දැනුම් දෙමි.

වක්‍ර ලේඛ අංක : 5 / 2004

මගේ අංකය:- බප/සසේකො/ලේ.නි.
සමූපකාර සේවක කොමිෂන් සභාව,
අංක 50, නිතුල්වත්ත පාර,
කොළඹ 08.
2004.10.11

බස්නාහිර පළාතේ සියලුම
සමූපකාර සමිති සභාපතිවරුන් වෙත,

<u>යතුරු පැදි දීමනාව සහ මුදල් අයකැමි අවදානම් දීමනාව වැඩි කිරීම</u>

බස්නාහිර පළාතේ විවිධ සේවා සමූපකාර සමිතිවල සභාපතිවරුන් විසින් කොමිෂන් සභාව වෙත කරනු ලැබූ ඉල්ලීම් සලකා බලා ඉහත සඳහන් දීමනාව පහත සඳහන් පරිදි සංශෝධනය කිරීමට කොමිෂන් සභාව තීරණය කර ඇත.

1. රාජකාරි කටයුතු සඳහා යතුරු පැදියක් යොදා ගැනීමට අනුමත කර ඇති නිලධාරීන්ට පරීක්ෂණ රාජකාරි ගමන්වල යෙදීමේදී දැනට ගෙවනු ලබන යතුරු පැදි දීමනාව වන. කිලෝ මීටරයට රු. 1.50 මුදල කිලෝමීටරයට රු. 2.50 දක්වා වැඩි කිරීම.

2. මුදල් අයකැමිවරුන් සඳහා දැනට ගෙවන අවදානම් දීමනාව වන රු. 30/- මුදල රුපියල් 50/- දක්වා වැඩි කිරීම.

ඒ අනුව කටයුතු කරන ලෙස කොමිෂන් සභාවේ නියමය පරිදි දැනුම් දෙමි.

ජේ.ජේ. සිරිසේන,
ලේකම්,
සමූපකාර සේවක කොමිෂන් සභාව,
බස්නාහිර පළාත.

2004.10.11 වන දින දී ය..

<u>පිටපත්</u>

1. ප්‍රධාන ලේකම් (බ.ප.)
2. ලේකම්- ඉඩම් කෘෂි, සමූපකාර, වෙළඳ, ආහාර අමාත්‍යාංශය
3. සමූපකාර සංවර්ධන කොමසාරිස් හා සමූපකාර සමිති රෙජිස්ට්‍රාර් (බ.ප.)
4. සමූපකාර සංවර්ධන සහකාර කොමසාරිස්(කොළඹ, කළුතර, ගම්පහ)
5. ලේකම්, සමූපකාර සේවක කොමිෂන් සභාව
6. සියළුම පළාත් සමූපකාර සේවක කොමිෂන් සභා ලේකම්වරුන්
7. සියළුම වෘත්තීය සමිති සංගම්